# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 92 — 1973 දෙසැම්බර් 28 වැනි සිකුරාදා — 1973.12.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (IIඅ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... ... | 1841 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1850 |


සැළකිය යුතුයි.—ලේඛ්‍යා ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, විදේශ විනිමය වැරදි කමා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සහ දේශිය ණය සහ සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත 1973 දෙසැම්බර් 14 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

## තනතුරු—ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරවනු ලබන රාජ්‍ය සේවා පත්කිරීම් වලට අදාළවන පොදු කොන්දේසි

1. අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්

1 : 1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

"ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබූවෙකි.

1 : 2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙක් වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනෙක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නා වූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

1 : 3 නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් අසමත්වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිත සේවය අවසන් කරනු ලැබූ "නව ප්‍රවේශක" රජයේ නිලධාරීන් ව සිටි අය, අංක 640 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදාළ තනතුරට හෝ සේවයට නියමිත වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන්දමේ සුදුසුකම් ලබා ගෙන සිටිතොත් මිස, එසේ නොමැති නම්, ඔවුන්ගෙන් ලැබෙන අයදුම් පත් භාරගනු නො ලැබේ.

2. දීමනා

2 : 1 ඒ ඒ තනතුරට අදාල මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්තියෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනාවක් ගෙවනු ඇත.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

### විශෙෂ නිවේදනයයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුලුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප්/වේතන ලබන ගණයට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50 ක විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය තැන මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

**3. සේවා කොන්දේසි : සාමාන්‍ය**

3 : 1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි, වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

3 : 2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥා පනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

3 : 3 දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැක.

**4. ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

4 : 1 ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ :—

**4 : 1 : 1** යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් විනා, එසේ නොමැති නම්, සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ, හේතුවක් නොදක්වා සේවය කෙළවර කරනු ලැබිය හැකිය.

4 : 1 : 2 රාජ්‍ය සේවයෙහි “නව ප්‍රවේශකයන්” වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානවලටත්, රාජ්‍යයෙහි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මකව පවත්නාවූත්, අනාගතයේදී පනවනු ලැබිය හැකිවූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 : 3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අන්දමේ ඇනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාල වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයෙහි II වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් (අවශ්‍ය නම්), අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්‍ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයන් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාල සීමාව ඉක්මී තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත් වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත් හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත් වන තෙක් හෝ පහත දැක්වෙන 4 : 1 : 5 වැනි වගන්තියෙහි විධි විධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේ ය.

4 : 1 : 5 පරිවාස කාල සීමාව අවසානයේදී සිංහල ප්‍රවීනතාවය පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වුවහොත්, එහි ලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධි විධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූ අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4 සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාළ නොවන්නේ ය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාල සීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැක.

4 : 1 : 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබුවා වූද අය හැර) තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

**5. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

5 : 1 1972. 01. 01 වැනි දිනට පසු, ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් රේට් ප්‍රමාණයන් ගෙවනු ලබන—සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේදී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් සියයට 9% ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් තව 6% ක් දක්වා වූ සෙච්ඡා දායක මුදලක් එම අරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971. 12. 31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන් 1972. 01. 01 වැනි දිනට පසු, රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වූවක් වශයෙන් යථෝක්ත විශ්‍රාම වැටුප් හිමිකම නොකඩවා භුක්ති විඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

**6. යුද්ධ සේවා අනුග්‍රහය**

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාවතීර්ණ හමුදාවන්හි සේවා මුක්ත භටයන්ටද සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්වී නොගිය අයට ද ඉහත කී සියලුම සුදුසුකම් තිබේනම්ද, ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද ඔවුන්ගේ එම සේවය සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අනුව සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස් වලින්, 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම්තමන් සේවය කළ කාලයක් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

7 : 1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූද රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදාහැරිය හැකිද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

7 : 2 නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

7 : 3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරාගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව අයථා අනුග්‍රහයක් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතු වනු ඇත.

7 : 4 අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

7 : 5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

**8. සුදුසුකම පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම**

8 : 1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

---

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරු සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් අතුරින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1974 ජනවාරි මස 21 වන දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මගින් අයදුම්පත් භාර ගැනීම අවසන් කෙරේ.

වැඩිදුර විස්තර අවශ්‍ය නම් පහත අත්සන් කරන අයගෙන් ලියා විමසන්න. කිසිම ලියවිල්ලක් පහත අත්සන් කරන අයගේ පුද්ගලික නමට එවිය යුතු නොවේ.

පී. කේ. දිසානායක,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන),
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

සෞඛ්‍ය අමාත්‍යාංශය,
තැ. පෙ. 500, ගාලු මුවදොර,
කොළඹ,
1973 දෙසැම්බර් මස 17 වන දින.

12–925—73.12.28 දින අංක 92 දරණ ගැසට් පත්‍රය

---

**අධිකරණ සේවා උපදේශක මණ්ඩලය—කාති තනතුර**

1969 අංක 32 සහ 1965 අංක 1 දරණ මුස්ලිම් විවාහ සහ දික්කසාද ආඥාපනත් යටතේ සංශෝධිත මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 ඡේදය) යටතේ අධිකරණ සේවා උපදේශක මණ්ඩලය විසින් මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තු සහ තුම්පනේ ආදායම් කොට්ඨාශයේ කාති තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 35 කට නොඅඩු, හොඳ චරිතයකින් සහ තත්ත්වයකින් යුතු ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන පිරිමි පක්ෂයේ මුස්ලිම් අය විය යුතුය.

3. පත්කිරීම සම්බන්ධයෙන් වූ නිවේදනයේ නියම කරනු ලබන කාල සීමාවකට අමාත්‍ය මණ්ඩලය විසින් තෝරා ගනු ලැබූ අපේක්ෂකයා තෝරා ගනු ලැබේ.

4. කාතිවරයෙකු වශයෙන් පත්වීම ලබන්නෙක් තමා පත්කර ඇති ප්‍රදේශයේ පදිංචිවීමට නීතියෙන් බැඳී සිටී.

5. මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි විශේෂ ආකෘති පත්‍රවල මෙම අයදුම් පත්‍ර සකස් කළ යුතු අතර ඒවා 1974 ජනවාරි මස 29 වැනි දිනට හෝ ඊට පෙර හෝ මෙම කාර්යාලයට ලැබෙන සේ එවිය යුතුය.

ලයනල් සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ
ලේකම්.

අධිකරණ සේවා උපදේශක සහ විනය මණ්ඩල කාර්යාලය,
සී/52, කැප්පෙටිපොල පාර,
තැ. පෙ. 573,
කොළඹ 5.
1973 දෙසැම්බර් මස 18 දින දීය.

12–1033—73.12.28 දින අංක 92 දරණ ගැසට් පත්‍රය

---

අංකය : විඅ/4/162.

**1974 මැලේසියානු පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව**

1974 මැලේසියානු පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවමින් අංක 89 සහ 1973. 12. 07 දින දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරන ලද නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 1973. 12. 31 දින දක්වා කල් දමා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

1973. 12. 19 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

12–1029—73.12.28 දින අංක 92 දරණ ගැසට් පත්‍රය

මගේ අංකය : සා/6/17.

**අධ්‍යාපන අමාත්‍යාංශයීය ගරාජයේ "ෆෝමර්න්" තනතුර**

අධ්‍යාපන අමාත්‍යාංශයීය ගරාජයේ "ෆෝර්මන්" තනතුර සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති සියළුම ආයතනයන්හි සහ දෙපාර්තමේන්තුවල සේවය කරන සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් හා බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘතිය අනුව පිළියෙල කළ අයදුම්පත් 1974 ජනවාරි මස 21 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ලේකම්ට ලැබෙන සේ එවිය යුතුය. කවරයේ වම් කෙළවරේ උඩ "ෆෝර්මන් තනතුර සඳහා අයදුම්පත්‍රය" යන්න සඳහන් කළ යුතුය.

2. **වැටුප් පරිමාණය.**—මෙම තනතුරුට රු. 4,152 ක වාර්ෂික වැටුපකින් ආරම්භව රු. 144 වාර්ෂික වැඩිවීම් 16 කින් යුක්තව හා වාර්ෂිකව රු. 5,304 ක වැටුප් තලයට ප්‍රථම වූ කාර්යක්ෂමතා කඩඉමක් සහිතව රු. 6,456 දක්වා වූ ඒකාබද්ධ වැටුප් පරිමාණයක් හිමිය. (1969. 10. 01 දිනට ප්‍රථම මීට අනුරූප මූලික වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 1,860—16 × 120—3,780 වර්ෂයකට රු. 2,820 ට ප්‍රථම කා. ක. ඉ.).

3. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. 71. 12. 31 දිනට පළමු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දැරූ අයෙකුට විශ්‍රාම වැටුප් සහිත තත්ත්වය තබා ගැනීමට ඉඩදෙනු ලැබේ.

(i) පත් කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයකු වන්නේ නම්, පරීක්ෂා කාල සීමාව අවුරුදු 3 ක් වන්නේය.

(ii) රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන්නකු තෝරා ගනු ලැබුවහොත්, පත්වීම නියමිත කාලයක වැඩ බැලීමේ තත්ත්වයේ පවතිනු ඇත.

(iii) පත් කරනු ලබන්නා තමාට නියම කරනු ලබන දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය.

(iv) සුදුස්සන් තෝරා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

4. **අවශ්‍ය සුදුසුකම්.**—මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙක්ම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 25 ට නො අඩු හා 40 ට නො වැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බලපානු නො ලැබේ.

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව.

(iii) කනිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ 8 වැනි ශ්‍රේණිය සමත්ව තිබීම සහ මෝටර් යාන්ත්‍රික වැඩ පිළිබඳව රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අවුරුදු 15 ක අදාළ සේවා පළපුරුද්ද. මෙම කාල සීමාවෙන් අඩු වශයෙන් අවු. 5 ක් "පෙර්මන්" තනතුරක සිටිය යුතුවේ.

හෝ

(iv) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ දෙකකට නො වැඩි වාර ගණනකදී ලබාගත් සිංහල/දෙමළ භාෂාව, අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය හෝ ඊට සමාන හෝ උසස් සහතිකයක් සහ මෝටර් යාන්ත්‍රික වැඩ පිළිබඳව රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අවුරුදු 10 ක අදාළ සේවා පළපුරුද්ද.

හෝ

(v) භෞතික විද්‍යාව ඇතුළුව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ දෙකකට නො වැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ භෞතික විද්‍යාව ඇතුළුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය හෝ ඊට සමාන හෝ උසස් සහතිකයක් සහ කනිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (යාන්ත්‍රික) සහතිකය හෝ ඉංජිනේරු කාර්මික නිලධාරීන්ගේ (යාන්ත්‍රික—නිෂ්පාදන) හෝ (යාන්ත්‍රික ස්වයංචලන) සහතිකය හෝ තාක්ෂණ විද්‍යාලයක ඩිප්ලෝමා (යාන්ත්‍රික නිෂ්පාදන) හෝ (යාන්ත්‍රික ස්වයංචලන) සහතිකය සහ මෝටර් යාන්ත්‍රික වැඩ පිළිබඳව රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අවුරුදු 5 ක අදාළ සේවා පළපුරුද්ද.

හෝ

(vi) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ උඩාකු ශ්‍රේණියේ වර්ෂයකට රු. 3,450—12 × 90—රු. 4,530 ඒකාබද්ධ වැටුපක් ඇති මෝටර් යාන්ත්‍රික තනතුරක අවුරුදු 5 කට නො අඩු සේවයක් ඇතුළුව මෝටර් රථවාහන නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම පිළිබඳව අවුරුදු 15 කට නො අඩු ප්‍රායෝගික දැනුමක් සහ පළපුරුද්දක් සමග පිළිගත් වැඩ පළක හෝ රජයේ දෙපාර්තමේන්තුවක් යටතේ සේවක පාලක පළපුරුද්දක් තිබීම.

5. සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසුව එවන අයදුම්පත් භාරගනු නො ලැබේ. එහෙත්, දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත්, පමණක් ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් භාරගනු ලැබේ.

6. තනතුර සඳහා සුදුස්සෙකු තෝරා ගැනීමේ ප්‍රමුඛත්වය දෙනු ලබන්නේ පහත සඳහන් අයුරිනි :—

(i) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති සියළුම ආයතනයන්හි සේවය කරන අයදුම්කරුවන්ට.

(ii) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල සේවය කරන අයදුම්කරුවන්ට.

(iii) බාහිර අයදුම්කරුවන්ට.

7. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි අවශ්‍ය වූ විට ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලාවලට ඇතුළත් වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව, නිකුත් කළ උප්පැන්න සහතිකය භාරගත නොහැක.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සහතික.

(ඇ) ප්‍රායෝගික පළපුරුද්ද සනාථ කරන සහතික.

8. මෙම ගැසට් පත්‍රයේ පළමු වැනි කොටසේ, දෙවන ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය පසුවී දින 21 ක් ගෙවුනු කළ පිළිතුරක් නොලදහොත් වහාම ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියහොත්, තම අයදුම්පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමිවනු ඇත.

————,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේදීය.

ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**අධ්‍යාපන අමාත්‍යාංශයීය ගරාජයේ ෆෝමන් තනතුර සඳහා ඉල්ලුම් පත්‍රයයි**

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. ස්ථිර ලිපිනය :————.

3. ගම් ප්‍රදේශය :————.

4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට නියම වයස :————.
උපන් දිනය :————.

5. උපන් ස්ථානය :————.
(අ) ඉල්ලුම්කරු :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
(ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
(ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

6. ලාංකිකත්වය පරම්පරාවෙන් ද, ලියාපදිංචි කිරීමෙන් ද යන වග :————.

7. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :————.

(i) සාමාන්‍යය :—

පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන්/අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් සමත්ව ඇති විෂයයන් පිළිබඳ විස්තර :—

| 1 වැනි වර | 2 වැනි වර |
|---|---|
| 1. ...................... | 1. ...................... |
| 2. ...................... | 2. ...................... |
| 3. ...................... | 3. ...................... |
| 4. ...................... | 4. ...................... |
| 5. ...................... | 5. ...................... |
| 6. ...................... | 6. ...................... |
| 7. ...................... | 7. ...................... |
| 8. ...................... | 8. ...................... |

(ii) වෘත්තීය හා/හෝ කාර්මික සහතිකවල විස්තර :——.

(iii) සිංහලෙන්/දෙමළෙන් සමත් වී ඇති උසස්ම විභාගයේ විස්තර :————.

(iv) ලබා ඇති වාහන පැදවීමේ බලපත්‍රය පිළිබඳ විස්තර :————.

8. නිවේදනයේ 4 වැනි ඡේදය යටතේ සේවා විස්තර (සේවය කළ ආයතනය, සේවා කාලයන්, දැරූ තනතුරු සඳහන් කළ යුතුයි.) :————.

9. විවාහකද, අවිවාහකද ? වැන්දඹුද ? :————.

10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් (අ) දිනය, (ආ) නඩු නොම්මරය, (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :—

11. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

12. පාඨශාලාවෙන් අස් වූ දින සිට යෙදී සිටි රක්ෂා :—

(i) දරණ ලද තනතුර :————.
(ii) නියුක්තව සිටිය වකවානුව :————.
(iii) අස්වීමට හේතුව :————.

13. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයන් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම් :—

(අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :———— .
(ආ) සේවයේ යෙදී සිටි කාලය :————.
(ඇ) සේවය නතර කිරීමට හේතු :————.

14. දැනට යෙදී සිටින රක්ෂාව :—

(i) ආයතනය :————.

(ii) තනතුර හා ශ්‍රේණිය :————.

(iii) ඊට පත්වූ දිනය :————.

(iv) විශ්‍රාම වැටුප් සහිත ද ? තාවකාලික හෝ අනියම් ද ? :————.

(v) දීමනා රහිත ව දැනට ලැබෙන වැටුප් හා වැටුප් ක්‍රමය :————.

(vi) ඊළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

15. වෙනත් කරුණු :————.

16. මේ අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

.........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය

අධ්‍යා./ලේ.

මගේ අංකය :
ඔබේ අංකය : සාප 6/17.

මෙම අයදුම්පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුය/පෙරය.*

ඉල්ලුම් පත්‍රයේ සඳහන්.........අංකිත ඡේදවල විස්තර නිවැරදි බැව්*/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව් මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

.........................................

.........................................

————,
දෙපාර්තමේන්තු*/ආයතන ප්‍රධානියාගේ අත්සන.

පදවි නාමය :————.

දිනය :————.

(*අදාළ නැති කොටස් කපා හරින්න.)

12–933—73.12.28 දින අංක 92 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරී ඇබෑර්තු

1. ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ පහත සඳහන් ඇබෑර්තු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

(අ) ලුතිනන් (ඉංජිනේරු විශේෂඥතාවය) (ඉ)

(ආ) ශිෂ්‍යභට නිලධාරී (විධායක) (වි)

(ඇ) ශිෂ්‍යභට නිලධාරී (ඉංජිනේරු විශේෂඥතාවය) (ඉ)

(ඈ) ශිෂ්‍යභට නිලධාරී (සැපයුම් විශේෂඥතාවය) (සැ)

**සංලක්ෂ්‍යය :** ඉහත (ආ) ඇබෑර්තු නැව් ශිල්පය සහ වෙනත් නාවික රාජකාරී සඳහා වේ.

2. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

3. සුදුසුකම්.—

| | ලුතිනන් (ඉ) | ශිෂ්‍ය භට (වි) | ශිෂ්‍ය භට (ඉ) | ශිෂ්‍ය භට (සැ) |
|---|---|---|---|---|
| (අ) වයස | 74.01.01 දිනට වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුයි | 74.01.01 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 21ට නොවැඩි විය යුතුයි | 74.01.01 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 21ට නොවැඩි විය යුතුයි | 74.01.01 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 21ට නොවැඩි විය යුතුයි |
| (ආ) ශාරීරික තත්ත්වය— | | | | |
| උස ... | 5'.4'' ... | 5'.6'' ... | 5'.6'' ... | 5'.6'' |
| බර ... | රා. 105 ... | රා. 110 ... | රා. 110 ... | රා. 110 |
| පපුව (ප්‍රශ්වාස කර) ... | 32'' ... | 32'' ... | 32'' ... | 32'' |
| දෘෂ්ටිය ... | 6/9 (දෙඇසේම) ... | 6/6 (දෙඇසේම) ... | 6/9 (දෙඇසේම) ... | 6/12 (දෙඇසේම) |
| වර්ණ දෘෂ්ටිය ... | 11 ප්‍රමාණය ... | 11 ප්‍රමාණය ... | 11 ප්‍රමාණය ... | 11 ප්‍රමාණය |

**සංලක්ෂ්‍යය.**—පත්වීමට පෙර, ඉහත සඳහන් අවශ්‍යතාවයන්ට අතිරේකව නාවික හමුදාධිපති සෑහීමට පත්වන පරිදි වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) විවාහක/අවිවාහක තත්වය ... | විවාහක/අවිවාහක ... | අවිවාහක විය යුතුයි ... | අවිවාහක විය යුතුයි ... | අවිවාහක විය යුතුයි |

(ආ) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්—

(I) **ලුතිනන් (ඉ).**—පිළිගත් විශ්ව විද්‍යාලයක කාර්මික ඉංජිනේරු විද්‍යා උපාධිධාරියෙකු විය යුතුයි. අවසාන පරීක්ෂණයට පෙනී සිට සමත් කරන ලද විෂයයන් අතර සමුද්‍ර ඉංජිනේරු විශේෂඥතාවයට අදාළ විෂයයන් වේ නම් වැඩි සැලකිල්ලක් දක්වේ ;

හෝ

ලන්ඩන්හි කාර්මික ඉංජිනේරුවන්ගේ ආයතනයේ හෝ ලන්ඩන්හි සමුද්‍ර ඉංජිනේරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙකු/ආශ්‍රිත සාමාජිකයෙකු විය යුතුයි ;

හෝ

ලන්ඩන්හි කාර්මික ඉංජිනේරුවන්ගේ හෝ සමුද්‍ර ඉංජිනේරුවන්ගේ ආයතනය මගින් අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සහිතව, ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනයේ සාමාජිකයකු/ආශ්‍රිත සාමාජිකයෙකු හෝ ඊට සමාන සුදුසුකම් ලබා සිටින්නෙකු විය යුතුයි.

(II) **ශිෂ්‍යභට නිලධාරි (වී).**—සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ඇතුළුව එක්වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් කර සිටිය යුතු අතර, දෙවරකට නොවැඩි වාර ගණනක දී පහත සඳහන් විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් තුනකට සම්මාන ලැබ සිටිය යුතුයි:—

ශුද්ධ ගණිතය
ව්‍යවහාර ගණිතය
භෞතික විද්‍යාව
රසායන විද්‍යාව
ජීව විද්‍යාව ; හෝ

ඊට උසස් ඕනෑම පරීක්ෂණයක්.

(III) **ශිෂ්‍යභට නිලධාරි (ඉ).**—සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ඇතුළුව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්කර සිටිය යුතු අතර, දෙවරකට නොවැඩි වාර ගණනකදී පහත සඳහන් විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් හතරකට සම්මාන ලැබ සිටිය යුතුයි:—

ශුද්ධ ගණිතය
ව්‍යවහාර ගණිතය
භෞතික විද්‍යාව
රසායන විද්‍යාව
ජ්‍යාමිතිය සහ යාන්ත්‍රික ඇඳීම ; සහ

පහත දක්වෙන ඕනෑම විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත් කර සිටිය යුතුයි:—

ශුද්ධ ගණිතය
ව්‍යවහාර ගණිතය
භෞතික විද්‍යාව
රසායන විද්‍යාව ; හෝ

ඉහත සඳහන් විෂයයන් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට විකල්ප ඕනෑම උසස් පරීක්ෂණයක් සමත් කර සිටිය යුතුයි.

(IV) **ශිෂ්‍යභට නිලධාරි (ස).**—සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින්, පහත සඳහන් ඕනෑම විෂයයන් තුනකට සම්මාන සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එක් වරක දී සමත් කර සිටිය යුතුයි:—

වාණිජ්‍යය
අර්ථ ශාස්ත්‍රය
ගණකාධිකරණය
අංක ගණිතය
වාණිජ අංක ගණිතය
ශුද්ධ ගණිතය
ව්‍යවහාර ගණිතය
භෞතික විද්‍යාව
රසායන විද්‍යාව ; හෝ

ඊට උසස් ඕනෑම අධ්‍යාපනික සුදුසුකමක් ලබා සිටිය යුතුයි.

4. **වැටුප් හා දීමනා.**—නාවික හමුද වැටුප් සංග්‍රහයේ සඳහන් පරිදි නිලයට නියමිත වැටුප් හා දීමනා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට පත්වීමේ දී ගෙවනු ලැබේ.

(අ) කොමාන්ඩර් නිලයේ නිලධාරීන් දක්වා සන්නද්ධ සේවා වැටුප් කමිටුව මගින් ගෙවීමට නිර්දේශ කර දනට ගෙවනු ලබන ඒකාබද්ධ වැටුප් පරිමාණයන් පහත සඳහන් අයුරිනි :—

| | | |
|---|---|---|
| ශිෂ්‍යභට | ... | වර්ෂයකට රු. 5,160 බැගින් |
| මිඩ්ෂිප්මන්වරුන් | ... | වර්ෂයකට රු. 5,520 බැගින් |
| වැඩබලන උප ලුතිනන් | ... | වර්ෂයකට රු. 5,880 බැගින් |
| උප ලුතිනන් | ... | වර්ෂයකට රු. 7,500න් පටන් ගෙන අවුරුදු පතා රු. 180 බැගින් වැඩිවීම් 5 කින් යුතුව රු. 8,400 දක්වා |
| ලුතිනන් | ... | වර්ෂයකට රු. 9,240 න් පටන් ගෙන අවුරුදු පතා රු. 180 බැගින් වැඩිවීම් 8 කින් යුතුව රු. 10,680 දක්වා |
| ලුතිනන් කොමාන්ඩර් | ... | වර්ෂයකට රු. 11,400 න් පටන් ගෙන අවුරුදු පතා රු. 240 බැගින් වැඩිවීම් 8 කින් යුතුව රු. 13,320 දක්වා |
| කොමාන්ඩර් | ... | වර්ෂයකට රු. 15,000 න් පටන් ගෙන අවුරුදු පතා රු. 360 බැගින් වැඩිවීම් 7 කින් යුතුව රු. 17,520 දක්වා |

(ආ) පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.

(i) නාවික වැටුප් සංග්‍රහයෙහි සලසා ඇති පරිදි සුදුසුතා වැටුප් ගෙවනු ලැබේ.

(ii) පහත සඳහන් පරිදි නිල ඇඳුම් දීමනා ගෙවනු ලැබේ. සර්ම කලාපීය නිල ඇඳුම් සඳහා මූලික දීමනාවක් වශයෙන් රුපියල් 1,000 ක් සහ මීට අමතරව මසකට රු. 25 බැගින් නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාවක්. ශිෂ්‍යභට නිලධාරීන්ට නාවික හමුදව මගින් සියළුම නිල ඇඳුම් නිකුත් කරනු ලබන අතර, නිල ඇඳුම් දීමනාවට හිමිකම් ලබන්නේ අධිකාරියට පත් කිරීමෙන් පසුව වේ.

(ඇ) **අතිකුත් දීමනාවන්.**—විවාහක නම්, ආණ්ඩුවේ පරිමාණයන් අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ. වෙන් වී සිටීමේ දීමනාව සහ අනුගාමික දීමනාවක් නාවික වැටුප් සංග්‍රහයෙහි සඳහන් පරිදි ගෙවනු ලැබේ.

5. සේවා කොන්දේසි.—(අ) කලින් කල සංශෝධනය කරනු ලැබූ 1950 දෙසැම්බර් 09 වැනි දින අංක 10,187 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිලධාරීන්ගේ රෙගුලාසි අනුව සේවා කොන්දේසි පාලනය වේ.

(ආ) තෝරා ගනු ලබන අපේක්ෂකයින් අර්ථසාධක අරමුදලට හිමිකරුවන් වන අතර රජය මගින් නිගමනය කරනු ලබන පරිදි සන්නද්ධ සේවා අර්ථසාධක අරමුදලට සිය වැටුපෙන් සියයට ප්‍රමාණයක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු නොලැබේ. කෙසේ වුවද, පත්වීමට පෙර දින ශ්‍රී ලංකා ජනරජයේ විශ්‍රාම වැටුප් හිමිකම් සහිත තනතුරක් දරණ ලද්දේ නම් කලින් කල සංශෝධනය කරනු ලැබූ 1962 දෙසැම්බර් 07 දින අංක 13,423 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1962 නාවික හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුකූලව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ඇත.

(ඇ) ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් රාජකාරිය සඳහා හෝ පුහුණුව සඳහා ඕනෑම විටක ලෝකයේ කුමන කොටසකට වුවත් පිටත්කර යැවිය හැක.

(ඈ) නව ප්‍රවේශකයින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත්, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පනවා ඇති මෙන්ම මතුවටත් පනවනු ලබන ව්‍යවස්ථාවලට අනුකූලව ක්‍රියා කිරීමට අවශ්‍ය වේ.

(ඉ) ශිෂ්‍යභට නිලධාරි ඇබෑර්තුවලට අයැදුම් කරන්නන්ගේ පමණක් දෙමාපියන් හෝ භාරකරුවන් විසින් මෙහි පහත 6 වැනි ඡේදයෙන් දක්වෙන අයුරින් ප්‍රකාශනයක් අත්සන් කරනු ලැබ එය අයැදුම්පත සමග එවිය යුතුය. තෝරා ගනු ලබන අපේක්ෂකයින් පත් කිරීමට පෙර ඔවුන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන් ජනරජයත් සමග එම ප්‍රකාශනයේ ආකෘතියට අනුකූලව වූ බැඳුම්කරයකට ඇතුළුවීමට අවශ්‍ය වනු ඇත.

(ඊ) අභ්‍යාස ප්‍රගුණ කරන කාලය තුළ දී ශිෂ්‍ය භටයින්ට/මිඩ්ෂිප්මන්වරුන්ට විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

6. අයැදුම්කරුගේ මව/පියා හෝ භාරකරු විසින් අත්සන් කළයුතු ප්‍රකාශය :

(අ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශිෂ්‍යභට තනතුර සඳහා ඉල්ලුම් කළ .................ගේ මව/පියා/භාරකරු මම වෙමි.

(ආ) ශ්‍රී ලංකාවේ හෝ එතෙර අභ්‍යාස පාඨමාලාවක් හැදෑරීම සඳහා ඉහත නම් සඳහන් අයැදුම්කරු තෝරාගනු ලැබුවහොත් පහත සඳහන් දෑ සඳහා වගකීමට මම මෙයින් පොරොන්දු වෙමි.

(i) අභ්‍යාස කාලය තුළ දී අයැදුම්කරුට දරන්නට සිදුවන සියළුම පෞද්ගලික වියදම් ;

(ii) ඉහත නම් සඳහන් අයදුම්කරු අභ්‍යාස කාලය තුළ දී, සිය කැමැත්තෙන්ම අධිකාරි අපේක්ෂකතාවය අත් හරින්නේ නම් ඔහු වෙනුවෙන් ජනරජය වැය කළ සියළුම වියදම් ජනරජයට ආපසු ගෙවීමට ;

(iii) ඉහත නම් සඳහන් අයැදුම්කරු තම අභ්‍යාස කාලය තුළ දී කුමන හෝ අවධියක (විෂමාචාරය හෝ ඔහුගේ අනුදැනුම පිට වෙනයම් හේතුන් නිසා) ඔහුට අධිකාරිය පිරිනැමීම නුසුදුසු යයි බලධාරීන් විසින් දන්වුවහොත් ජනරජය විසින් ඔහු වෙනුවෙන් වැය කළ සියළුම වියදම් ජනරජයට ආපසු ගෙවීමට.

————————,
අත්සන.

නම සහ ලිපිනය පැහැදිලි අකුරින් :————.

දිනය :————.

————————,
සාක්ෂිකරුගේ අත්සන.

නම සහ ලිපිනය පැහැදිලි අකුරින් :————.

දිනය :————.

7. අයදුම්කරුවන්ට උපදෙස්.—පහත සඳහන් කර ඇති ආකෘති පත්‍රයට අනුකූලව ලිඛිත අයැදුම පත් 1974 ජනවාරි 30 වැනි දිනටපෙර කොළඹ, තැ.පෙ. 593, නාවික හමුදා මූලස්ථානයේ නාවික හමුදාපතිට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

8. රජයේ සේවයේ හෝ සංස්ථා සේවයේ යෙදී සිටින නිලධාරීන් තම දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුතු අතර, තෝරා ගනු ලැබුවහොත් නිලධාරියා මුදා හැරිය හැකි බවට සහතිකයක් ඉල්ලුම් පත්‍රයෙහි අඩංගු විය යුතුය.

9. පහත සඳහන් සහතිකවල පිටපත් ඉල්ලුම් පත්‍රය සමග එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) කියා සිටින අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික ; සහ

(ඇ) යටත් පිරිසෙයින් අයැදුම්කරු පුද්ගලකව හඳුනන වගකිව යුතු පුද්ගලයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික දෙකක්. ඉන් එකක් අයැදුම්කරු අවසන් වරට ඉගෙනීම ලැබූ පාඨශාලාවේ ප්‍රධානියාගෙන් විය යුතුය.

10. ඉහත සඳහන් කොන්දේසි සපුරාලන අයැදුම්කරුවන්ගෙන් මූලික තෝරා ගැනීම කරනු ලැබේ. මූලික සම්මුඛ පරීක්ෂණයේ දී තෝරා ගනු ලබන අපේක්ෂකයින්ගේ නාවික සේවය සඳහා යෝග්‍යතාවය පරීක්ෂා කර බැලීමේ විශේෂ කෞශල්‍යය පරීක්ෂණයට පෙනී සිටීම අවශ්‍ය වේ. ඉන්පසු තෝරා ගනු ලබන අපේක්ෂකයින්, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන තෝරා ගැනීමේ මණ්ඩලයක් විසින් අවසාන තෝරා ගැනීම සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය, දිනය හා වේලාව ලියා දන්වනු ලැබේ. මෙම කරුණ වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් වියදම් ශ්‍රී ලංකා ජනරජය මගින් ගෙවනු නොලැබේ.

ඩී. බී. ගුණසේකර,
කොමදෝරු,
නාවික හමුදාපති.

1973 දෙසැම්බර් 18 වැනි දින,
කොළඹ,
ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයේ දී ය.

### ශ්‍රී ලංකා නාවික හමුදාව—නිලධාරි තනතුර සඳහා අයැදුම් පත

1. අයැදුම් කරනු ලබන තනතුර :————.
2. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
3. ජාතිය (ලංකා පුරවැසි භාවය පරම්පරාවෙන් ද, නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද යන්න හා ලියාපදිංචි වීමෙන් නම් සහතිකයේ අංකය හා දිනය සඳහන් කරන්න) :————.
4. ලිපිනය :————.
5. උපන් දිනය :
   1974 ජනවාරි මස 01 දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.
6. ආසන්න පොලිස් ස්ථානය :————.
7. ඡන්ද කොට්ඨාශය :————.

8. දෙමාපියන්ගේ නම්, උපන් ස්ථාන හා වර්තමාන ලිපිනයන් :—

| | සම්පූර්ණ නම | උපන් ස්ථානය | ලිපිනය |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

9. ඔබ විවාහක ද, අවිවාහක ද යන වග :————.

10. ඔබ පාසැලේ දී ලත් ක්‍රීඩා පිළිබඳ විශිෂ්ඨ සම්මාන මොනවා ද ? :————.

11. ඔබ පාසැලේ දී ලබා ඇති වෙනත් විශේෂ දක්ෂකම් මොනවාද ? :————.

12. මීට පෙර සන්නද්ධ සේවාවක, ස්වේච්ඡා භට කණ්ඩායමක, ශිෂ්‍ය භට කණ්ඩායමක හෝ බාලදක්ෂ ව්‍යාපාරයක කර ඇති සේවය :————.

13. මෙම පත්වීම සඳහා ඔබ සතුව ඇති වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද ? :————.

14. මීට පෙර කිනම් හෝ සන්නද්ධ සේවාවක ඇබෑර්තුවක් සඳහා ඔබ අයදුම් කර තිබේද ? එසේ නම් එහි ප්‍රතිඵල :————.

15. ඔබගේ පාසැල් කාලය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

| විද්‍යාලයේ නම | දිනය | | සමත් වූ ආණ්ඩුවේ විභාග සහ විෂයයන් |
|---|---|---|---|
| | ඇතුළුවීම | අස්වීම | |
| | | | |

16. විද්‍යාලයෙන් අස්වූවාට පසු නියුක්තව සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

| ස්වාමියාගේ නම | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :—

(අ) :————.

(ආ) :————.

ඉහත සඳහන් ප්‍රශ්නවලට මා විසින් සපයා ඇති පිළිතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. ගැසට් පත්‍රයෙහි පළ කර ඇති පරිදි ශ්‍රී ලංකා නාවික හමුදාවේ...........තනතුර සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින් කෙරෙහි බලපාන ව්‍යවස්ථා මෙන්ම, නිලධාරින්ගේ වැටුප් හා සේවා කොන්දේසි සහ උසස්වීමේ හැකියාවන් කෙරෙහි බලපාන සේවා කොන්දේසි ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

12–936/1—73.12.28 දින අංක 92 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා නාවික හමුදාව

### නිලධාරීන්ගේ තනතුරු සඳහා ඇබෑර්තු

ශ්‍රී ලංකා නාවික හමුදාවේ විධායක අංශයේ නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට ශ්‍රී ලංකා නාවික හමුද නිත්‍ය බලකායේ උප ලුතිනන් නිලයේ ස්ථිර අධිකාරි ලබාදෙනු ඇත.

3. තෝරා ගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකාවේ/එතෙර අභ්‍යාස පාඨමාලා හැදෑරීමට අවශ්‍ය වේ.

4. **සුදුසුකම්.**—අයදුම්කරුවන්—

(අ) ශ්‍රී ලංකා පුරවැසියන් වීම.

(ආ) අවිවාහක විය යුතු අතර 1974 ජනවාරි 01 වැනි දිනට වයස අවුරුදු 18 අඩු නොවිය යුතු අතර අවුරුදු 24ට වැඩි නොවිය යුතු ය.

(ඇ) (i) පහත සඳහන් විෂයයන් 2 කින් සම්මාන සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණය සමර්ථ වී සිටීම.

| | |
|---|---|
| ශුද්ධ ගණිතය | රසායන විද්‍යාව |
| ව්‍යවහාර ගණිතය | උද්භිද විද්‍යාව |
| භෞතික විද්‍යාව | සත්ව විද්‍යාව ; හෝ |

(ii) ඉහත සඳහන් විෂයයන් සහිතව උසස් අධ්‍යයන සහතිකයක් සතුව තිබීම.

සටහන.—(1) ක්‍රීඩා පිළිබඳ විශිෂ්ඨත්වයන් දන්වනු ලැබූ අපේක්ෂකයින් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(2) දක්වා ඇති අධ්‍යාපනික සුදුසුකම් හෝ වෙනත් උසස් සුදුසුකම් ඇතොත්, ඉහත 4 (අ) සහ (ආ) ඡේදවල සඳහන් සුදුසුකම් ඇති ස්වේච්ඡා නාවික බලකායේ නිලධාරීන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ආ) **ශාරීරික තත්ත්ව.**—
උස අඩි 5 අඟල් 4
බර : රා. 110
පපුව (ප්‍රාශ්වාසකර) අඟල් 32
දෘෂ්ටිය : 6/9 (දෙඇසේම)
වර්ණ දෘෂ්ටිය : 11 ප්‍රමාණය

(ඉ) **වෛද්‍යතක්තවය**—නාවික හමුදාවට අවශ්‍ය වන පරිදි සෞඛ්‍ය තත්ත්වයට අපේක්ෂකයින් යෝග්‍යව සිටිය යුතු අතර, පත්වීමට පෙර නාවික පිළියෙළ කිරීමකින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමර්ථ විය යුතුය.

5. **වැටුප් හා දීමනා.**—නාවික හමුද වැටුප් සංග්‍රහයෙහි සඳහන් පරිදි නිලයට නියමිත වැටුප් හා දීමනා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට පත්වීමේ දී ගෙවනු ලැබේ.

(අ) කොමාන්ඩර් නිලයේ නිලධාරීන් දක්වා සන්නද්ධ සේවා වැටුප් කමිටුව මගින් ගෙවීමට නිර්දේශ කර දැනට ගෙවනු ලබන ඒකාබද්ධ වැටුප් පරිමාණයන් පහත සඳහන් අයුරිනි :—

උප ලුතිනන්—වර්ෂයකට රුපියල් 7,500න් පටන්ගෙන අවුරුදු පතා රුපියල් 180 වැඩිවීම් 5 කින් යුතුව රුපියල් 8,400 දක්වා.

ලුතිනන්—වාර්ෂිකව රුපියල් 9,240න් පටන්ගෙන අවුරුදු පතා රුපියල් 180 වැඩිවීම් 8 කින් යුතුව රුපියල් 10,680 දක්වා.

ලුතිනන් කොමාන්ඩර්—වාර්ෂිකව රුපියල් 11,400න් පටන්ගෙන අවුරුදු පතා රුපියල් 240 වැඩිවීම් 8 කින් යුතුව රුපියල් 13,320 දක්වා.

කොමාන්ඩර්—වාර්ෂිකව රුපියල් 15,000න් පටන්ගෙන අවුරුදු පතා රුපියල් 360 වැඩිවීම් 7 කින් යුතුව රුපියල් 17,520 දක්වා.

(ආ) පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ :—

(i) නාවික වැටුප් සංග්‍රහයෙහි සලසා ඇති පරිදි සුදුසුකා වැටුප් ගෙවනු ලැබේ.

(ii) පහත සඳහන් පරිදි නිල ඇඳුම් දීමනා ගෙවනු ලැබේ. සර්ම කලාපීය නිල ඇඳුම් සඳහා මූලික දීමනාවක් වශයෙන් රුපියල් 1,000ක් මීට අමතර ව මසකට රු. 25 බැගින් නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාවක්.

(iii) අනිකුත් දීමනාවන්—විවාහක නම්, ආණ්ඩුවේ පරිමාණ යන් අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ. වෙන් වී සිටීමේ දීමනාව, සහ අනුගාමික දීමනාවන් නාවික වැටුප් සංග්‍රහයෙහි සඳහන් පරිදි ගෙවනු ලැබේ.

6. සේවා කොන්දේසි—

(අ) කලින් කල සංශෝධනය කරනු ලැබූ 1950 දෙසැම්බර් 9 වැනි දින අංක 10,187 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිලධාරින්ගේ රෙගුලාසි අනුව සේවා කොන්දේසි පාලනය වේ.

(ආ) තෝරාගනු ලබන අපේක්ෂකයින් අර්ථසාධක අරමුදලට හිමිකරුවන් වන අතර, රජය මගින් නිගමනය කරනු ලබන පරිදි රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට සිය වැටුපෙන් සියයට ප්‍රමාණයක් දයක මුදල් වශයෙන් ගෙවිය යුතු ය. විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු නොලැබේ. කෙසේ වුව ද, ශිෂ්‍ය භටයෙකු වශයෙන් පත්වීමට පෙර දින ශ්‍රී ලංකා ජනරජයේ විශ්‍රාම වැටුප් හිමිකම් සහිත තනතුරක් දරන ලද්දේ නම් කලින් කල සංශෝධනය කරනු ලැබූ 1962 දෙසැම්බර් 7 දින අංක 13,423 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1962 නාවික හමුද විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුකූලව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ඇත.

(ඇ) ශ්‍රී ලංකා නාවික හමුද නිලධාරීන් රාජකාරිය සඳහා හෝ පුහුණුව සඳහා ඕනෑ ම විටක ලෝකයේ කුමන කොටසකට වුවත් පිටත්කර යැවිය හැක.

(ඈ) නව ප්‍රවේශකයින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍යභාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා දනට පනවා ඇති මෙන් ම මතුවටත්, පනවනු ලබන ව්‍යවස්ථාවලට අනුකූලව ක්‍රියා කිරීමට අවශ්‍ය වේ.

7. අයදුම් කරුවන්ට උපදෙස්.—1974 ජනවාරි 30 වැනි දිනට පෙර මෙම දන්වීමෙහි දක්වෙන ආකෘති පත්‍රයට අනුකූලව අයැදුම් පත් කොළඹ, තැ.පෙ. 593, නාවික හමුද මූලස්ථානයේ, නාවික හමුදපතිට ලැබෙන සේ ඉදිරිපත් කළ යුතු වේ. ''නිලධාරි පුරප්පාඩු'' යන්න ඉල්ලුම් පත් අඩංගු කවරයේ සටහන් කළ යුතුයි. අයදුම් පත් ලැබුණ බව දන්වා එවනු ලැබේ.

8. රජයේ සේවයේ හෝ සංස්ථාවල සේවයෙහි යෙදී සිටින නිලධාරීන් දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉල්ලුම් කළ යුතු අතර, තෝරාගනු ලැබුවහොත් නිලධාරියා මුද හැරිය හැකි බවට සහතිකයක් ඉල්ලුම් පතෙහි අඩංගු විය යුතුය.

9. ඉල්ලුම්පත් සමග එවිය යුතු පිටපත්—

(අ) උප්පැන්න සහතිකය

(ආ) කියා සිටින අධ්‍යාපනික සුදුසුකම් සහතික

(ඇ) යටත් පිරිසෙයින් අයදුම්කරු පුද්ගලිකව හඳුනන වගකිවයුතු පුද්ගලයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික දෙකක්.

10. ඉහත සඳහන් කොන්දේසි සපුරාලන අයැදුම්කරුවන්ගෙන් මූලික තෝරාගැනීම කරනු ලැබේ. මූලික සම්මුඛ පරීක්ෂණයේ දී තෝරාගනු ලබන අපේක්ෂකයින්ගෙන් නාවික සේවය සඳහා යෝග්‍යතාවය පරීක්ෂාකර බැලීමේ විශේෂ කෞශල්‍ය පරීක්ෂණයට පෙනී සිටීම අවශ්‍ය වේ. ඉන්පසු තෝරාගනු ලබන අපේක්ෂකයින්, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන තෝරා ගැනීමේ මණ්ඩලයක් විසින් අවසාන තෝරා ගැනීම සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය දිනය හා වේලාව ලියා දන්වනු ලැබේ. මෙම කරුණ වෙනුවෙන් ගමන් වියදම් ශ්‍රී ලංකාණ්ඩුව මගින් නොගෙවනවා ඇත.

ඩී. බී. ගුණසේකර,
කොමදෝරු,
නාවික හමුදපති.

1973.12.18,
කොළඹ,
ශ්‍රී ලංකා නාවික හමුද මූලස්ථානයේ දී ය.

## ශ්‍රී ලංකා නාවික හමුදව—නිලධාරි තනතුරු සඳහා අයදුම් පත

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ජාතිය (ලංකා පුරවැසි භාවය පරම්පරාවෙන් ද, නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද යන්න හා ලියාපදිංචි වීමෙන් නම් සහතිකයේ අංකය හා දිනය සඳහන් කරන්න) :————.

3. ලිපිනය :————.

4. උපන් දිනය :————.

1974 ජනවාරි 01 දිනට වයස :————. අවුරුදු :————. මාස :————. දින :————.

5. ආසන්න පොලිස් ස්ථානය :————.

6. ඡන්ද කොට්ඨාශය :————.

7. දෙමාපියන්ගේ නම්, උපන් ස්ථාන හා වර්තමාන ලිපිනයන් :

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | ලිපිනය |
|---|---|---|
| පියා | | |
| මව | | |

8. ඔබ විවාහක ද, අවිවාහක ද යන වග :————.

9. ඔබ පැසැලේ දී ලත් ක්‍රීඩා පිළිබඳ විශිෂ්ඨ සම්මාන මොනවාද ? :————.

10. ඔබ පැසැලේ දී ලබා ඇති වෙනත් විශේෂ දක්ෂකම් මොනවාද : :————.

11. මීට පෙර සන්නද්ධ සේවාවක, ස්වෙච්ඡා භට කණ්ඩායමක, ශිෂ්‍ය භට කණ්ඩායමක හෝ බාලදක්ෂ ව්‍යාපාරයක කර ඇති සේවය :————.

12. මෙම පත්වීම සඳහා ඔබ සතුව ඇති වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද? :————.

13. මීට පෙර කිනම් හෝ සන්නද්ධ සේවාවක ඇබැර්තුවක් සඳහා ඔබ අයදුම් කර තිබේ ද ? එසේ නම් එහි ප්‍රතිඵල : ————.

14. ඔබගේ පාසැල් කාලය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

| විද්‍යාලයේ නම | දිනය | | සමත් වූ ආණ්ඩුවේ විභාග සහ විෂයයන් |
|---|---|---|---|
| | ඇතුළුවීම | අස්වීම | |
| | | | |

15. විද්‍යාලයෙන් අස්වූවට පසු නියුක්තව සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

| ස්වාමියාගේ නම | රැකියාවේ ස්වභාවය | සේවාකාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

16. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :————.

(අ) ————.

(ආ) ————.

ඉහත සඳහන් ප්‍රශ්නවලට මා විසින් සපයා ඇති පිළිතුරු මගේ දැනීමෙ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. ගැසට් පත්‍රයෙහි පළ කර ඇති පරිදි ශ්‍රී ලංකා නාවික හමුදවේ නිලධාරි තනතුරු සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින් කෙරෙහි බලපාන ව්‍යවස්ථා මෙන් ම නිලධාරීන්ගේ වැටුප් හා සේවා කොන්දේසි සහ උසස්වීමේ හැකියාවන් කෙරෙහි බලපාන සේවා කොන්දේසි ද මම කියවා අවබෝධ කර ගතිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සාමාන්‍ය ලිපිකාර සේවයේ 2 වන පන්තියේ "අ" ඛණ්ඩයට පත් කිරීම සඳහා වූ විභාගය—1973 නොවැම්බර්**

1973 නොවැම්බර් මස 24 වන දින පැවැත්වීමට නියමිතව තිබී කල් දමන්නට යෙදුන පූර්වෝක්ත විභාගය, 1974 ජනවාරි මස 26 වන දින පවත්වනු ලබන බව සියලුම විභාග අපේක්ෂකයන් වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

1973 දෙසැම්බර් මස 19 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේදී ය.

12–1030—73.12.28 දින අංක 92 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය**
**ප්‍රජාචාරය— විෂයය නිර්දේශය**

1974 දෙසැම්බර් විභාගයේ සිට බලපැවැත්වෙන පරිදි ප්‍රජාචාරය පිළිබඳ විෂයය නිර්දේශය පහත දැක්වෙන අයුරින් සංශෝධනය කර ඇති බව සියලුම විදුහල්පතීන් හා අයදුම්කරුවන් වෙත මෙයින් දන්වනු ලැබේ.

ප්‍රජාචාරය

ප්‍රශ්න පත්‍රය කොටස් තුනකට බෙදනු ලැබේ. එක් කොටසකින් ප්‍රශ්න දෙකකට නො වැඩිව, එහෙත් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත්ව, තෝරාගත් ප්‍රශ්න පහකට පෑ 3 ක් තුළදී පිළිතුරු ලිවීම අයදුම්කරුවන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ. එක් එක් කොටස ප්‍රශ්න හතරකින් යුක්ත වනු ඇත.

විශේෂ වශයෙන් විදේශීය ආයතන හෝ සංස්ථා හෝ පිළිබඳව සඳහන් කර තිබුණොත් විනා අධ්‍යයනය සඳහා නිර්දේශ කර ඇත්තේ දේශීය ආයතන වේ. මෙම ආයතන හා ඒවා මිනිසාගේ එදිනෙදා ජීවිතය කෙරෙහි බලපාන අන්දම ගැන විශේෂ අවධානය යොමු විය යුතු අතර එම අධ්‍යයනය හැකිතාක් කලානුරූප විය යුතුයි. එසේම, හැකිතාක් දුරට, ඒ එකිනෙක ආයතනය සංසන්දනය කරමින් ද, ඒ ඒ ආයතන පිහිටි රටෙහි ඉතිහාසමය හා භූගෝලීය සාධක පසුබිම් කරගෙන අධ්‍යයනය කළ යුතුය. ප්‍රජාව පිළිබඳ කටයුතුවලදී විද්‍යානුකූල ලෙස සිතීමට අයදුම්කරුවන් කෙතෙක් දුරට පුහුණු කර ඇති දැයි පිරික්සීම සඳහා ද, ප්‍රශ්න සකස් කරනු ලැබේ. ආණ්ඩු ක්‍රම පිළිබඳ සෛද්ධාන්තික දැනුමක් අපේක්ෂා කරනු නොලැබේ. එහෙත් සමකාලීන වෙනස්වීම් පසුබිම් කරගෙන පහත සඳහන් දෑ අධ්‍යයනය කළ යුතුයි.

**I කොටස : මිනිස් සමාජය**

(අ) මිනිස් සමාජයේ අවශ්‍යතා—ආහාර, නිවාස, සෞඛ්‍යය, ආරක්ෂාව, අධ්‍යාපනය, රැකීරක්ෂා ආදිය, ඒවා සැපයීම පිළිබඳ රාජ්‍යයේ හා රටවැසියන්ගේ අයිතිවාසිකම් හා යුතුකම්.

(ආ) සමාජ අවශ්‍යතා සපුරාලීම සඳහා ඉදිරිපත් වී ඇති සංවිධාන—

(i) රාජ්‍යාංශය—දෙපාර්තමේන්තු හා නීතිගත සංස්ථා.

(ii) සාමූහික ප්‍රයත්න—සමුපකාර සංවිධාන, වෘත්තීය සමිති හා වෙනත් ස්වේච්ඡා සංවිධාන.

(iii) පෞද්ගලික අංශය.

(ඇ) ආර්ථික සංවර්ධන අරමුණු හා ඒවා ක්‍රියාත්මක කිරීමෙහිලා රාජ්‍යාංශයට, සාමූහික ප්‍රයත්නයට හා පෞද්ගලික අංශයට පැවරෙන වගකීම්.

(ඈ) ප්‍රජාතාන්ත්‍රික සමාජයක මූලික ලක්ෂණ.

**II කොටස : ශ්‍රී ලංකාව ජනරජයක් වශයෙන්**

(i) ශ්‍රී ලංකාවේ ජනරජයක් බිහිවීම—ඓතිහාසික පසුබිම ලුහුඬින් (මෙහිදී සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් අපේක්ෂා කෙරේ).

(ii) ඡන්ද දායකයෝ, ඡන්ද කොට්ඨාශ, දේශපාලන පක්ෂ හා මැතිවරණ.

(iii) ජාතික රාජ්‍ය සභාව—එහි ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය, කථානායක, සභානායක, විපක්ෂ නායක.

(iv) අගමැති හා ඇමති මණ්ඩලය.

(v) ජනාධිපති.

(vi) පාලන තන්ත්‍රය—රටවැසියන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා පාලන තන්ත්‍රය ක්‍රියාත්මක වන අයුරු.

(vii) අධිකරණය—අධිකරණයේ ව්‍යුහය, බලතල හා කාර්යභාරයන්, අධිකරණයේ ස්වාධීනත්වය.

(viii) ප්‍රාදේශීය පාලනය :—

(1) දිස්ත්‍රික්ක පාලනය—දිසාපති, ආදායම් පාලන නිලධාරි, ග්‍රාමසේවක හා වෙනත් නිලධාරීහු.

(2) පළාත් පාලන සභා.

(3) වෙනත් බලමණ්ඩල—සාම මණ්ඩල, ජනතා කමිටු, දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කමිටු, ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල, යනාදිය.

**III කොටස : ශ්‍රී ලංකාව ලෝක ජනතාවගේ කොටසක් වශයෙන්**

(1) ශ්‍රී ලංකාව—එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයකු ලෙස : මානව ප්‍රශ්න මට්ටමෙන් විසඳීමේ ආයතනයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය අධ්‍යයනය කළ යුතුයි.

(අ) එක්සත් ජාතීන්ගේ සංවිධානය—එහි පරමාර්ථ හා ප්‍රතිපත්ති—මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශන කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වමින් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය පිළිබඳ සාමාන්‍ය අවබෝධයක්.

(ආ) එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එහි ක්‍රියාකාරක මණ්ඩල—මහා මණ්ඩල, ආරක්ෂක සභාව, ආර්ථික හා සාමාජික සභාව, භාරකාර සභාව, අන්තර් ජාතික අධිකරණය, මහ ලේකම් කාර්යාලය.

(ඉ) අනුබද්ධ ක්‍රියාකාරක මණ්ඩල හා විශේෂ ක්‍රියාකාරක මණ්ඩල (එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධාන (යුනෙස්කෝව—එ. ජා. අ. වි. සං. ස.) ආහාර හා කෘෂිකර්ම පිළිබඳ සංවිධානය (ආ. කෘ. ස.), ලෝක සෞඛ්‍ය සංවිධානය (ලො. සෞ. ස.), අන්තර් ජාතික කම්කරු සංවිධානය (අ. ක. ස.), ආසියාව හා ඈත පෙරදිග සඳහා ආර්ථික සභාව (ආ. ඈ. පෙ. ආ. ස.), අන්තර් ජාතික මූල්‍ය අරමුදල (අයි. එම්. එෆ්.) හා ලෝක බැංකුව (අයි. බී. ආර්. ඩී.).

(2) ශ්‍රී ලංකාවේ විදේශීය සම්බන්ධතා—විදේශීය ප්‍රතිපත්තිය, තානාපති සේවය.

(3) ශ්‍රී ලංකාව බැඳී සිටින වෙනත් ජාත්‍යන්තර සංවිධාන : පොදු රාජ්‍ය මණ්ඩලය නොබැඳි ජාතීන්ගේ සමුළුව යනාදිය.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

1973 දෙසැම්බර් මස 18 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

12–1037—73.12.28 දින අංක 92 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**පෙරදිග සංගීතය සහ නැටුම් පිළිබඳ සහතික පත්‍ර විභාගය, (අවසාන)—1973**

1. විභාගය පවත්වන දිනය.—

විද්‍යාව පිළිබඳ

මෙම විභාගය 1974 පෙබරවාරි මස 23 වැනි දින පවත්වනු ලැබේ.

2. විභාග මධ්‍යස්ථාන.—2–01. කොළඹ, මීගමුව, කළුතර, මහනුවර, ගාල්ල, රත්නපුරය, කෑගල්ල, බදුල්ල සහ කුරුණෑගල.

(අභ්‍යාසය පිළිබඳ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොළඹ, මහනුවර, ගාල්ල සහ කුරුණෑගල යන මධ්‍යස්ථානවල පමණකි. එය පවත්වනු ලබන දිනය හා ස්ථානයත් අයදුම්කරුවන්ට පසුව දනුම් දෙනු ලැබේ.)

2–02. අයදුම්කරුවන් සෑහෙන ගණනක් ඇතුළු වී නැති කවර මධ්‍යස්ථානයක් වුවත් අවලංගු කරනු ලැබේ.

3. **විභාග පරිපාටිය.**—3–01. මේ විභාගය කොටස් තුනකින් පවත්වනු ලැබේ, එනම් :—

(අ) පෙරදිග සංගීතය—ගායනය,

(ආ) පෙරදිග සංගීතය—වාදනය,

(ඉ) උඩරට නැටුම.

3–02. අයදුම්කරුවකුට ඇතුළත් විය හැක්කේ ඉහත සඳහන් කොටස් තුනෙන් එකකට පමණි.

3–03. (අ) කොටස හා (ආ) කොටස ශීර්ෂ දෙකකින් යුක්ත වේ. එනම්:—විද්‍යාව හා අභ්‍යාසයත්ය. විභාගයෙන් සමර්ථවීමට අයදුම්කරුවකු එක් එක් ශීර්ෂයෙන් ප්‍රමාණවත් තත්ත්වයකට පැමිණ තිබිය යුතුයි. විද්‍යාව පිළිබඳ ප්‍රශ්න පත්‍රයේ කාලය පැ දෙකකි.

3–04. සංගීත වාදනය සම්බන්ධයෙන් පහත සඳහන් තූර්ය භාණ්ඩ පමණක් වාදනය කිරීමේ ප්‍රවීණතාව පරීක්ෂා කළ හැක්කේය. එනම්:—(i) රවි කිඤ්ඤය, (ii) තබ්ලාව, (iii) සිතාරය, (iv) දිල්රුබාව, (v) වීණාව, (vi) මෘදංගය, (vii) බටනළාව, (viii) සාරංගී, (ix) සරෝද්, (x) ජල තරංග, (xi) එස්රාජ්. (xii) ෂෙණයි, (xiii) නළ තරංග,

එක් අවුරුද්දකදී ඇතුළු විය හැක්කේ මේ තූර්ය භාණ්ඩවලින් එකක් සම්බන්ධයෙන් පමණි. අභ්‍යාසය පිළිබඳ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් අවශ්‍ය තූර්ය භාණ්ඩ ගෙන ආ යුතුය.

3–05. අභ්‍යාසය පිළිබඳ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් තිබෙන්නේ විද්‍යාමය විභාගයෙන් සාමාර්ථය වූ අයදුම්කරුවන්ට පමණි.

3–06. අවසාන කොටස සම්බන්ධයෙන් සහතික පත්‍ර ප්‍රධානය කරනු ලැබේ.

4. **නිර්දේශ පත්‍ර.**—මේ විභාගය පවත්වනු ලබන්නේ ලංකා ගාන්ධර්ව සභාවේ විභාග නිර්දේශ පත්‍රය අනුවය.

5. **සුදුසුකම්.**—අවසාන විභාගයට පෙනී සිටිය හැක්කේ ගාන්ධර්ව සභාවේ මධ්‍යය විභාග සහතිකය ලබා තිබෙන අයට පමණකි.

6. **විභාගයට ඇතුළු කර ගැනීම.**—මෙම ව්‍යවස්ථා අනුව හා නියමිත ගාස්තුව ගෙවා ඉල්ලුම්කරන සියළුම අයදුම්කරුවෝ ලිඛිත පරීක්ෂණයකට ඇතුළත් කරනු ලැබෙත්.

7. **පරීක්ෂණයට ඇතුළුවීමට ඉල්ලීම.**—7–01. මෙම නිවේදනයෙහි අග පළවන ආදර්ශ ආකෘතිය අයදුම්කරු විසින් ම පිළියෙල කර ගන්නා ලද අයදුම් පතක් නිසියාකාර සම්පූර්ණ කිරීමෙන් මෙම පරීක්ෂණයට ඇතුළුවීමට ඉල්ලුම් කළ යුතුය. **මුද්‍රිත අයදුම් පත් මෙම දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු නොලැබේ.**

7–02. අයදුම්පත සකස් කිරීමේදී මෙහි පහත දැක්වෙන උපදෙස් අකුරටම පිළිපැදිය යුතුය. ඒවා නොසලකා හැරීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ :—

(අ) ෆුල්ස්කැප් ඉරුවක, එනම් 8" × 13" ප්‍රමාණයේ කඩදාසියක අයදුම් පත පිළියෙල කරනු විනා වෙනත් ප්‍රමාණයේ කඩදාසියක් ප්‍රයෝජනයට නොගත යුතුය.

(ආ) ටයිප් රයිටරයක් මගින් අයදුම්පත පිළියෙල කළ ද වරදෙක් නැත. අත් අකුරෙන් පිළියෙල කරන්නේ නම් අයදුම් පතෙහි ආකෘතිය රතු තීන්තෙන් විය යුතුය. අයදුම්පත් සම්පූර්ණ කිරීම නිල් හෝ කලු තීන්තෙන් කළ යුතුය.

(ඉ) ඉරි ඇඳ අයදුම්පතේ කොටු වෙන් කරන්න. කොටු වෙනස් කිරීම හෝ අත්හැරීම නොකළ යුතු ය. කොටු එකවෙක ගොඩ නොගැසෙන ලෙස ද කොටුවල ලිවීමට අපහසු නොවන ලෙස ද ඉතා හොඳ අන්දමින් කොටු සඳහා ඉඩ වෙන් කළ යුතුය.

7–03. අයදුම්පත්‍රය අයදුම්කරු විසින් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. එසේ සම්පූර්ණ කොට නොමැති අයදුම්පත්‍ර, සපයන ලද කරුණු අනුව සලකා බලා විභාගයට පෙර ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාගයට පසුව නම් අයදුම්කරුවන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

7–04. අයදුම්කරුගේ අත්සන සහතික කිරීමට බලය ලත් කෙනෙකු විසින් එය සහතික කළ යුතුයි. එනම්, සාමදාන විනිශ්චයකාරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, පෙරකදෝරු කෙනෙකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, නාවුක, ගගන හෝ ගොඩ යුද්ධ හමුදුවක කොමිෂන් නිලධාරියෙකු, රුපියල් 4,800 හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු හෝ ආණ්ඩුවේ හෝ අධ්‍යක්ෂ පාලිත හෝ අනුමත කළ පාසලක ප්‍රධානයකු, හෝ එවැනි පාසලක එම තත්ත්වයේ සිට විශ්‍රාම ලත් අයකු, කොට්ඨාශයේ ග්‍රාම සේවක තැන හෝ බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමක පූජ්‍යස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු හෝ ලවා සම්පූර්ණ කරවා ගත යුතුය.

7–05. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය 1974 ජනවාරි මස 15 වැනිදය. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර එදින හෝ එදිනට පෙර කොළඹ 2, මැලේ වීදියේ, විභාග කොමසාරිස් වෙත ලැබෙන සේ රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. අයදුම් පත්‍ර බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ විභාගයේ නමද, තමන් ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය ද සටහන් කළ යුතුය.

7–06. අයදුම් පත්‍ර ලැබුන බව දන්වා එවනු නොලැබේ.

7–07. කිසියම් ලියවිල්ලක් අයදුම් පත්‍රය සමග නො එවිය යුතුය :—

8. **විභාග ගාස්තු.**—විභාගයේ ඒ ඒ කොටස් සඳහා පහත සඳහන් ගාස්තු ගෙවිය යුතුය.

| වාදනය විද්‍යාව හා අභ්‍යාසය | ගායනය විද්‍යාව හා අභ්‍යාසය | උඩරට නැටුම් අභ්‍යාසය පමණක් |
|---|---|---|
| රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 20 00 | 20 00 | 20 00 |

සෑම අයදුම්කරුවෙකුම තම අයදුම්පත්‍රයට නියමිත මුද්දර අලවා ඒ පිට තම අත්සන හා දිනය යෙදීමෙන් එය අවලංගු කළ යුතුය. අත්සන යෙදීමෙන් අවලංගු නොකර මුද්දර එවීම සම්බන්ධයෙන් කාර්යාලය වග කියන්නේ නැත.

9. **අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීම.**—9–01. පහත දැක්වෙන පරිදි එවනු ලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කොට ඒ බැව් අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. අයදුම්කරු විභාගයට පෙනී සිට ඇතොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(අ) අසම්පූර්ණ හෝ දෝෂ සහිත හෝ අන් කිසි විධියකින් ව්‍යවස්ථානුකූල නොවන අයදුම් පත්‍ර.

(ආ) නියමිත මුද්දර ගාස්තු නැති අයදුම් පත්‍ර.

(ඉ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම් පත්‍ර.

9–02. අයදුම්පත් ප්‍රතික්ෂේප කළ විට මුද්දර ගාස්තු රාජසන්තක වේ.

10. **මුදල් ආපසු නොදීම.**—අසනීප වීම හෝ අන් කරුණක් නිසා විභාගයට පෙනී නොසිටීම ඇතුළු කිසිම කරුණක් සඳහා ගෙවන ලද මුදල් හෝ ඉන් කොටසක් ආපසු ගෙවනු නොලැබේ.

11. **ප්‍රවේශ පත්‍ර.**—11–01. විභාගය පැවැත්වීමට දින හතකට පමණ පෙර පුවත්පත් මගින් ප්‍රවේශ පත්‍ර නිකුත් කළ බැව් දැනුම් දෙනු ලැබේ. එවැනි දැන්වීමක් ගැන සෑම අයදුම්කරුවෙක්ම සැලකිල්ලෙන් සිටිය යුතුය. එය පළවූ විට එහි සඳහන් උපදෙස් අනුව වහාම ක්‍රියා කළ යුතුය.

11-02. යම් හෙයකින් අයදුම්කරුවෙකුට ප්‍රවේශ පත්‍රයක් නොලැබුනහොත් ඔහු විසින් කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස් වෙත (තැපැල් පෙට්ටිය අංක 1503, විදුලිපණිවුඩ ලිපිනය : '' විභාග '' කොළඹ) ප්‍රවේශ පත්‍රය නොලැබුණ බව නොපමාවම දන්වා එවිය යුතුයි. විදුලි පුවතකින් මෙසේ දන්වීම වඩා හොඳය. හැකි නම් පැමිණ කොළඹ 2, මැලේ වීදියේ විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රවේශපත්‍ර ශාඛාවෙන් විමසන්න. ඒ සෑම විටකම පහත සඳහන් විස්තරය සැපයිය යුතුය. එනම් :—

(i) විභාගයේ නම :————.

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————,

(iii) සම්පූර්ණ ලිපිනය :————,

(iv) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ මධ්‍යස්ථානය :————,

(v) අයදුම් පත්‍රය එවූ දිනය, එය රෙජිස්ටර් කළ තැපැල් පළ හා රෙජිස්ටර් අංකය :————.

12. හැඳින්වීමේ පත්‍ර.—12-01 අයදුම්කරුවන් විසින් විභාග ශාලාවේදී තමන් එක් එක් විෂයකට පෙනී සිටින විට විභාග ශාලාධිපතීන්ට පිළිගත හැකි පරිදි තමන් පිළිබඳ අනන්‍යතාව ඔප්පු කළ යුතුයි. මේ සඳහා පහත සඳහන් වන ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ :—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල් තුමා විසින් නිකුත් කරන ලද හැඳින්වීමේ පත්‍රිකාවක් (Identity Card)

(ආ) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද ඇතුළත නිකුත් කරන ලද්දා වූ ද වලංගුව පවත්නා වූද, '' පාස්පෝට් '' (Pass Port) බලපත්‍රයක්

(ඉ) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද තුළ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් විසින් හෝ රජයේ ආඥාවකින් බලය ලත් ආයතනයකින් හෝ නිකුත් කරන ලද්දා වූ ද, තම ඡායා රූපය දරන්නාවූ ද සහතික පත්‍රයක් හෝ බලපත්‍රයක් (Licence) හෝ වෙනත් ලියවිල්ලක්

(ඊ) පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක්, එහි පිට පැත්තේ පහත දැක්වෙන සහතිකය සැපයිය යුතුය. එසේ සහතික කළ යුත්තේ අත්සන් පත්‍රය සහතික කිරීමට බලය ලත් කෙනෙකු විසින් ය :—

පිට පැත්තේ පෙනෙන ඡායාරූපය ..................................................................

(අයදුම්කරුගේ සම්පූර්ණ නම)

..................................................................ගේ බවත්, පහත යොදා ඇත්තේ ඔහුගේ/ඇගේ අත්සන බවත්, මම සහතික කරමි.

————, ————,

අයදුම්කරුගේ අත්සන. සහතික කරන්නාගේ අත්සන

————,

දිනය :————, නම සහ තත්ත්වය.

ඉහත දැක්වෙන ලියකියවිලිවලින් එකක් ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය තාවකාලික ලෙස සලකනු ලැබේ. විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි එවැන්නකුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ.

වෙනත් කරුණු.—මෙම ව්‍යවස්ථාවන්හි සඳහන් නොවූ යම්කිසි කරුණක් පිළිබඳ තීරණය විභාග කොමසාරිස් විසින් කරනු ලැබේ.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

1973 දෙසැම්බර් මස,
කොළඹ 2, මැලේ වීදියේ විභාග දෙපාර්තමේන්තුවේ දීය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**පරෙදිග සංගීතය සහ නැටුම් පිළිබඳ සහතික පත්‍ර විභාගය (අවසාන) 1973**

1. අයදුම්කරුගේ නම (පැහැදිලි අකුරෙන්)
   - ව්‍යවහාර නාමය ...
   - මුලකුරු සහිතව ...
   - සම්පූර්ණ නාමය ...

ව්‍යවහාර නාමය අත්සන් කිරීමේදී පාවිච්චි කරන නාමයම විය යුතුය. සම්පූර්ණ නාමය උප්පැන්න සහතිකයේ සඳහන් වන සම්පූර්ණ නාමයයි. කිසියම් වෙනසක් වේ නම් ඒ බව නීත්‍යානුකූල දිවුරුම් පෙත්සමකින් ඔප්පු කළ යුතුය.

2. ලිපිනය ...

ස්ත්‍රී පුරුෂ භාවය

විභාගයට පෙනී සිටීමට කැමැති මධ්‍යස්ථානයේ නම

1. ..................................

2. ..................................

2. විභාගයට පෙනී සිටින්නේ
   - (අ) ගායනයටද ?
   - (ආ) වාදනයටද ?
   - (ඉ) උඩරට නැටුම්වලට ද ?

4. වාදනයට නම් ප්‍රයෝජනයට ගන්නා තුර්‍ය භාණ්ඩ කවරේද ?

5. සමාර්ථය ලබා ඇති ගන්ධර්ව සභාවේ මධ්‍යම විභාගයේ විස්තර ...

වර්ෂය :.................. විභාග අංකය :.........................

විභාග මධ්‍යස්ථානය : ..................................................................

6. විභාග ගාස්තු

මා විසින් මෙහි අලවන ලද මුද්දර කලින් පාවිච්චි නොකළ හොඳ මුද්දර බව මම සහතික කරමි.

මුද්දරවල වටිනාකම රු..........ශ.........

අයදුම්කරුගේ අත්සන :..........................................................

දිනය :..................................................

මුද්දර අලවන කොටුව

> සැලකිය යුතුයි
>
> මුද්දර එක පිට එක ඇලවිය යුතු නොවේ.
> අයදුම්කරුගේ අත්සන සහ දිනය යෙදීමෙන් මුද්දර අවලංගු කළ යුතුයි.
>
> අත්සන කොටසක් මුද්දරවලද කොටසක් කඩදාසියේද සිටින ලෙස යෙදිය යුතුය.

| | |
|---|---|
| 7. අයදුම්කරුගේ සහතිකය | මේ අයදුම් පතෙහි ලියන ලද කරුණු සැබෑ බව මම සහතික කරමි. තවද, විභාග කොමසාරිස් තුමා විසින් ප්‍රසිද්ධ කරන ලද මේ විභාගය පිළිබඳ ව්‍යවස්ථාවලට හා විභාග ශාලාවේදී අයදුම්කරුවන් සඳහා පණවන ලද අණපනත්වලටත් මා අවනත බැව් පිළි ගනිමි.<br><br>දිනය :................................................ ..........................................<br>අයදුම්කරුගේ අත්සන. |

8. ..........................................................................................................................වන මම ඉහත සඳහන් වන අයදුම්කරු ..................................................................................................................පදිංචි කෙනෙකු බවද, මා ඔහු හොඳාකාර අඳුනන බවද, 19......ක්වූ................................................................මස..................වැනි දින මා ඉදිරියෙහි අත්සන් තබන ලද බවද සහතික කරමි.

ලිපිනය :

සහතික කරන අයගේ අත්සන : ..........................................

..........................................................................

තරාතිරම : ..........................................................

..........................................................................

..........................................................................

දිනය : ..............................................................

## විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඩුවම් එකක් හෝ ඊට වැඩි හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම ;

(ii) විභාගයේ එක් විෂයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස්සකු කිරීම ;

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම ;

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම ;

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම ;

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලිසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

### නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂකයන්ට ද, බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිට වන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුයි.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය භාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම ද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරණ ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාගශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමඟ මොනම කරුණක් නිසාවත් කතාබස්කිරීම හෝ පනිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම්ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදු වෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර, තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුයි. මේ නීතිය නොසැළකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නො කළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහි ම කොටසක් විය යුතුයි. (එබඳු කටු වැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි) විභාග ශාලාවේ දී ලියන ලද කිසි ම දෙයක් ඉන් පිටත ගෙන යෑම තහනම්ය. එක ම ප්‍රශ්නයකට පිළිතුරු දෙ තැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුර පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණන් කොහෙත් ම නොසද හෝ නිවැරදි පිළිතුරු දක්වීමත්, චිත්‍ර කර්මයෙහි දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව එසේ නැතිනම් බොහෝ සෙයින් සිටවූව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත් පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර, අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදිය ද, ෆයිල් කවර්, කාර්ඩ් බෝර්ඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද විභාග ශාලාව තුළ කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නො ගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසි ම අපේක්ෂකයකු අත කිසි ම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළ හොත් සෑම අපේක්ෂකයා ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම ද හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නො කළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද වෙන අයදුම්කරුවෙකුන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නො දැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත්, ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වූවොත් විභාගශාලාධිපතීන්ගේ සහකාර නිළධාරියකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදියකට භාජන විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්**

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට වත් කලින් විභාගශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාගශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතීන්ට ඒ බැව් සැලකර එම සැකය දුරු කර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේදී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවේදී ඉදිරිපත් නොකළ හොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලෙජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නො පමාව ම විභාගශාලාධිපතීන්ට දන්විය යුතුය. විභාග ශාලාවේ දී ඔබටම දෙනු ලබන කඩදසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නො කර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණන චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්ට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චිකරන සෑම කඩදසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නො ලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංකය ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරු වල දී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදසි සියල්ල ම ප්‍රශ්න වලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නො ගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින්ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමටද හේතුවිය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැඟීට අත පමණක් එසවිය යුතුය.

12-922—73.12.28 දින අංක 92 දරණ ගැසට් පත්‍රය

**දෙහිවල බහුතාක්ෂණික ආයතනයේ ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා දෑවුරුදු දිවා පූර්ණකාලීන පාඨමාලාවට සිසුන් බඳවා ගැනීම**

දෙහිවල බහුතාක්ෂණිකායතනයේ පවත්වනු ලබන "ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා දෑවුරුදු දිවා පූර්ණකාලීන පාඨමාලාව" සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. මෙම පාඨමාලාව හැදෑරීමට කැමති අයදුම්කරුවන් මෙහි පහත සඳහන් ආදර්ශ අයදුම් පත්‍රය අයුරු අයදුම් පතක් සකස් කොට 1974.1.21 දිනට හෝ ඊට ප්‍රථම විදුහල්පති, බහුතාක්ෂණිකායතනය, දෙහිවල, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. පසුව ලැබෙන අයදුම් පත් භාරගනු නො ලැබේ.

3. **සුදුසුකම් :—**

(අ) අයදුම්කරුවන් ලාංකිකයින් විය යුතුය.

(ආ) වයස—අයදුම්කරුවන් 1974.01.01 දිනට වයස අවුරුදු 17ට නොඅඩු විය යුතුය.

(ඇ) අධ්‍යාපනික සුදුසුකම්.—අයදුම්කරුවන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විෂයයන් තුනකින් සමත්වී සිටීම හා, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව "අ" නිර්දේශයෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් සමත්වීම හෝ ඉංග්‍රීසි භාෂාව "ආ" නිර්දේශයෙන් සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

4. අයදුම්කරුවන් තෝරා ගැනීම ලිඛිත පරීක්ෂණයකින් හා/හෝ සම්මුඛ පරීක්ෂණයකින් වේ.

වී. ඕ. පී. ප්‍රනාන්දු,
අධ්‍යාපන අධ්‍යක්ෂ (කාර්මික),
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

කොළඹ 2,
මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.
18.12.1973.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**ඉංග්‍රීසි ඩිප්ලෝමා දෑවුරුදු දිවා පූර්ණකාලීන පාඨමාලාව—දෙහිවල බහුතාක්ෂණිකායතනය**

1. සම්පූර්ණ නම :———.
(පැහැදිලි අකුරෙන්)
2. ලිපිනය :———.
3. උපන් දිනය :———.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
4. වයස (1974.01.01 දිනට) :— අවුරුදු :———, මාස :———, දින :———.
5. ජාතිය :———.
6. දෙමාපියන්ගේ හෝ භාරකරුගේ නම සහ ලිපිනය :———.
7. ඉගෙනගත් ද්විතීය පාසලේ නම සහ ලිපිනය :———.
8. සමත්වූ විභාගයන්, විෂයයන් හා ලබාගත් තත්ත්වය :———.
(විශිෂ්ඨ සාමාර්ථ, සම්මාන සාමාර්ථ හා සාමාන්‍ය සාමාර්ථ)

| (අ) අ. පො. ස. (උසස් පෙළ) | (ආ) අ. පො. ස. (සාමාන්‍ය පෙළ) |
|---|---|
| 1. | 1. |
| 2. | 2. |
| 3. | 3. |
| 4. | 4. |
| | 5. |
| | 6. |
| | 7. |

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

12–1027—73.12.28 දින අංක 92 දරණ ගැසට් පත්‍රය

**අධ්‍යාපන අමාත්‍යාංශය—කණිෂ්ඨ කාර්මික ආයතනය—රත්මලාන**

**පාඨමාලාවලට ඇතුලත්වීම—1974 අධ්‍යයන වර්ෂය**

රත්මලාන කණිෂ්ඨ කාර්මික ආයතනයේ පහත සඳහන් අධ්‍යයන පාඨමාලාවට ඇතුළත්වීම සඳහා ඉල්លුම් පත් කැඳවනු ලැබේ :—

| පාඨමාලාව | මාධ්‍ය | කාලපරිච්ඡේදය | කාලය |
|---|---|---|---|
| 1. ගොඩනැගිලි වෘත්තීය | සිංහල ... | අවුරුදු 2යි ... | පූර්ණ දිවා කාල |

2. අයදුම්කරුවෝ 1974 ජනවාරි මස 1 දිනට වයස අවුරුදු 18ට අඩු විය යුතුය. එනම්, 1956 ජනවාරි මස 1 දිනට පසුව උපන් අය විය යුතුය.

3. අයදුම්කරුවෝ අටවෙනි ශ්‍රේණිය සමත්වී තිබිය යුතුය.

4. සියළුම ඉල්ලුම් පත්‍ර රත්මලාන කණිෂ්ඨ කාර්මික ආයතනයේ විද්‍යාලයාධිපති වෙත 1974.1.21 දිනට හෝ ඊට ප්‍රථම ඔහුට ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් ආදර්ශය පහත සඳහන් වේ.

5. අසම්පූර්ණ හෝ නියමිත ආකෘති පත්‍රයෙහි නිසි ලෙස පුරවා නොමැති හෝ ප්‍රමාදවී ලැබුන හෝ සියළුම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වී. ඕ. පී. ප්‍රනාන්දු,
අධ්‍යාපන අධ්‍යක්ෂ (කාර්මික
අධ්‍යාපනය),
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 දෙසැම්බර් මස 18 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය—(12" × 8")**

**කණිෂ්ඨ කාර්මික ආයතනය, රත්මලාන—අධ්‍යයන වර්ෂය 1974**

(සැ.යු.—මෙම අයදුම් පත සම්පූර්ණ කොට රත්මලාන කණිෂ්ඨ කාර්මික ආයතනයේ විද්‍යාලයාධිපති වෙත කෙලින්ම එවිය යුතුය)

1. පාඨමාලාව :—ගොඩනැගිලි වෘත්තීය/දිවා———,
2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :———,
(පැහැදිලි අකුරින්)
3. මුලකුරු සමග නම :———.
4. (අ) උපන් දිනය :———.
(ඇ) 74.1.1 ට වයස :— අවු :———, මාස :———, දින :———.
5. ජාතිය :———.
6. ස්ත්‍රී පුරුෂ භාවය :———.
7. පුද්ගලික ලිපිනය :———.
8. සාමාර්ථය ලත් විභාග :———.
(වර්ෂය සහ මාසය සඳහන් කරන්න) විෂයයන් සහ ප්‍රවීනතා සහිතව
9. පියාගේ/භාරකාරයාගේ නම, ලිපිනය සහ රක්ෂාව :———.
10. මෙහි ඉහත සඳහන් කරුණු සැබෑ බවට සහතික කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

12–1028—78.12.28 දින අංක 92 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

### 1973

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් | ... | 73.12.07 | සිකුරාද | ... | 73.11.28 | බදාදා | දහවල් | 12.00 |
| | | 73.12.14 | සිකුරාද | ... | 73.12 05 | බදාදා | දහවල් | 12.00 |
| | | 73.12.21 | සිකුරාද | ... | 73.12.12 | බදාදා | දහවල් | 12.00 |
| | | 73.12.28 | සිකුරාද | ... | 73.12.19 | බදාදා | දහවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 අගෝස්තු මස 18 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.